**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2017**

**------------------------------------------------------------------------------**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 32(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 119 ඡේදය ප්‍රකාරව රු.6,054,415 ක් වූ පූර්ව වර්ෂ ගැලපීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂයට ගැලපීම් කර දැක්වීම වෙනුවට කාලපරිච්ඡේදයට අදාළ ගැළපීමක් ලෙස දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහයට එකතු කළ යුතු ඉඩමකට අදාලව ලියාහැර තිබූ කල්බදු මුදල වූ රු.473,480 ක අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් අඩුකර දක්වා තිබූ අතර වර්ෂයේ පාරිතෝෂික වියදම වූ රු.1,025,423 ක අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා නොතිබුණි.

(ii) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ විස්තීර්ණ කොටසේ ගැලපුම් කර තිබූ ඉකුත් කාලපරිච්ඡේද ගැලපුම් රු.6,054,475 ක් හා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ ගැලපුම්කර තිබූ ප්‍රත්‍යාගණන අතිරික්තය රු.186,456 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා නොතිබුණි.

(iii) ජාතික විද්‍යා පදනමින් සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු.4,115,848 ක් හා එම මුදලින් පරීක්ෂණ සඳහා වැය කල රු.184,149 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වෙන වෙනම දැක්වීම වෙනුවට ඉතිරි මුදල වූ රු.3,931,699 ක අගය ප්‍රාග්ධන සංචලනයන් යටතේ දක්වා තිබුණි.

(iv) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබූ ශේෂ 3 ක් සඳහා ජර්නල් සටහන් මගින් සිදුකර තිබූ රු.4,214,000 ක ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට ගැලපීම වෙනුවට කාරක ප්‍රාග්ධන සංචලනය යටතේ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

පෙර වර්ෂවල වියදම් ලෙස හඳුනාගෙන තිබූ පුහුණු පාඨමාලාවලදී භාවිතා කරනු ලබන මැණික් ගල්වල පිරිවැය රු.519,800 ක් සමාලෝචිත වර්ෂයේ සිට වත්කම් ලෙස හඳුනාගෙන තිබුණද, ගිණුම් ප්‍රතිපත්තිවල සිදුව තිබූ මෙම වෙනස්කම ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.45,198,453 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයට ක්ෂය රු. 1,045,231 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වටිනාකම රු.18,608 ක් වූ මැණික් ගල් හා වටිනාකම රු.237,590 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගොඩනැගිලි කුලී වියදම රු.248,388 ක් හා ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.8,851 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

(ඈ) නිලධාරීන්ගෙන් ලබාගෙන තිබූ ආපසු ගෙවිය යුතු ආරක්ෂණ තැන්පතු රු.10,000 ක් ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

මැණික් නිර්මාණ හා තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම්වලින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු මුදල මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ලේඛණ අනුව රු.5,936,817 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු.6,654,479 ක් වූයෙන් රු.717,662 ක පැහැදිලි නොකල වෙනසක් පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

නිලධාරීන් 5 දෙනෙකු විදේශ ගතවීමට අදාළව වැයකල රු.841,241 කට අදාළ ගෙවීම් වවුචර් හා තහවුරු ලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 ජුනි 30 දින සේවයෙන් ඉවත් වූ සේවකයෙකුගෙන් අයකරගත යුතු රු.123,497 ක සේවක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) පාඨමාලා අවසන් කරන ලද සිසුන් 12 දෙනෙකුට අදාල රු.24,000 ක ආපසු ගෙවිය යුතු තැන්පතු වර්ෂ 4 ක් ගතවී තිබුණද ආපසු ගෙවා නොතිබුණි.

(ඇ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.6,654,479 ක් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම ආයතනයට ගෙවිය යුතු ශේෂයන් දක්වා නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 හා 105 | වාහන අනතුරු 2 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව පැවති නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.216,325 ක් වටිනා චෙක්පත් 31 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන රු.817,033 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග පොතෙන් සමාලෝචිත වර්ෂය තුල කපාහැර තිබුණි. තවද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 101 සිට 109 දක්වා සහ 760 ප්‍රකාරව කටයුතු කර ද නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,311,124 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,587,711 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,898,835 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන රු.3,813,000 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු.8,065,113 කින් හා සේවා ලබාගැනීම් සඳහා ගෙවීම් රු.3,255,677 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනය 2014 හා 2016 වර්ෂවල අතිරික්තයක් වාර්තා කර තිබුණද 2013 හා 2015 සහ 2017 වර්ෂවල ඌනතාවයන් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේ රු.26,882,287 ක් වූ ආයතනයේ දායකත්වය, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.66,179,762 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

----------------

#### 4.1.1 සැලසුම් කිරීම

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය 2017-2021 කාලපරිච්ඡේදය සඳහා පිළියෙළ කර තිබූ සංයුක්ත සැලැස්ම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතනය ස්ථාපිත කිරීමේදී ඇතිකරගෙන තිබූ එක් එක් අරමුණ ඉටුකර ගැනීම සඳහා වූ ඉදිරි වසර 5 හි සැලසුම් වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

(ii) සැලසුම් සකස් කිරීමේදී හඳුනාගෙන තිබූ ආයතනයේ ශක්තීන් හා දුර්වලතා ද ආයතනික පරිසරයේ අවස්ථාවන් තර්ජන ද මනා ඇගයීමකට ලක්කර අරමුණු ඉටුකර ගැනීමට උචිත ක්‍රමෝපායන් තීරණය කර නොතිබුණි.

(iii) එක් එක් අරමුණට අදාළව කාලීනව ළඟාකරගත යුතු ඉලක්ක සපුරා ගැනීමේ වගකීම් මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූල පදනමකින් බෙදාහැර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන සමස්ථ ආයතනය සඳහාම ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර මානව සම්පත් හා පරිපාලන, පර්යේෂණ සහ පුහුණු අංශ සඳහා පමණක් ආංශික සැලසුම් පිළියෙළ කර තිබුණි. පුහුණු අංශයේ පාඨමාලා ආදායම සැලසුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) පුහුණු අංශය විසින් ප්‍රධාන ක්‍රියාකාරකම් 4 ක් යටතේ රු.37,200,000 ක් වැයකර ඉටුකල යුතු කාර්යයන් වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිබුණද, එම ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය දක්වමින් කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඊට අදාළ කාර්යසාධනය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

## 4.1.2. ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ මැණික් තැන්පතු ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතියට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යසාධනය ලඟාකර ගත හැකිවන පරිදි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2009 - 2011 කාලය තුළ දිස්ත්‍රික්ක 18 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුව පැවතුණද 2017 වර්ෂය දක්වා කාලය තුළ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක පමණක් මැණික් නිධි ගවේෂණය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය දක්වා රු.21,973,348 ක් වැයකර තිබුණි.

(ii) කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම තවදුරටත් පිළියෙල කරමින් පවති අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක් සඳහා මැණික් විභව සිතියම් සහ අවසාන වාර්තා සකස් කර තිබුණද ඒවා සම්මත ක්‍රමවේදයට සකසා නොතිබුණි. මේ හේතුව නිසා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන සම්මත ක්‍රමවේදයට අනුව සිතියම් සකස් කිරීම 2017/2018 වර්ෂ තුළ ආරම්භ කර තිබුණි.

(iii) ව්‍යාපෘතියේ 26 ක්වූ අනුමත කාර්ය මණ්ඩලය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ නිලධාරීන්ගෙන් සපුරා ගැනීමටත්, ඒ සඳහා වැටුපට අතිරේකව සියයට 50 ක දීමනාවක් ගෙවීමටත්, උපදේශක තනතුර සඳහා පමණක් කොන්ත්‍රාත් පදනම මත බාහිරින් බඳවා ගැනීමටත්, 2009 ජූලි 14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය දී තිබුණද මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවකයන් 12 දෙනෙකු සහ බාහිර උපදේශකවරයෙකු පමණක් ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍ය බවට යෝජනාවේ දක්වා තිබූ ජ්‍යෙෂ්ඨ භූ විද්‍යාඥ, භූ විද්‍යාඥ, විදුලි ක්‍රියාකරු, පර්යේෂණ සහකාර, රසායනාගාර සහකාර හා තොරතුරු පද්ධති සහකාර නොමැතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(v) ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් නොවූ ගණකාධිකාරී, මානව සම්පත් කළමනාකරු හා ගිණුම් ලිපිකරු යන සේවකයන් සඳහා ව්‍යාපෘති කාර්යය වෙනුවෙන් වැටුපෙන් සියයට 20 ක දීමනාවක් සහ සැලසුම්කරු හා කම්කරුවන් තිදෙනෙකු සඳහා වැටුපෙන් සියයට 50ක දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියක් රහිතව ගෙවා තිබුණි.

(vi) 2017 සිට 2031 දක්වා අදියර 3 ක් යටතේ රු. මිලියන 300.65 ක පිරිවැයක් මත ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 48 ක් ආයතනයේ උත්පාදිත ආදායමෙන් සහ 2016 නොවැම්බර් 22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2017/2021 කාලය සඳහා රු.මිලියන 76.5 මහා භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට සැලසුම් කර තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 176.15 ක ප්‍රමාණය සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද මැණික් ඉඩම් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් වෙන්දේසි කිරීමේදී ලැබෙන ආදායමෙන් සියයට 25 ප්‍රමාණයෙන් හා මැණික් විභව සිතියම් අලෙවි කිරීමෙන් ලබන ආදායමෙන් පියවා ගැනීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද ඒ සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රධාන ක්‍රියාකාරකම් 8 ක් සඳහා රු.13,250,000 ක් ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන්කර තිබුණද රු.7,225,000 ක් වැයකර නොතිබුණි. එහිදී රු.300,000 වෙන්කර තිබූ ක්‍රියාකාරකම් 2 ක් ඉටුකර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 6 ක මූල්‍ය කාර්යසාධනය සියයට 38 ට වඩා අඩුවීය.

(ii) ප්‍රදේශ 4 ක ප්‍රවර්ධන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම්කර රු.400,000 ක් ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන්කර තිබුණද, එම කාර්යයන් ඉටු නොකර ප්‍රදර්ශන පැවැත්වීම, පොතක් මුද්‍රණය, අධි තාක්ෂණ උපකරණ සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම, පුවත්පත් ලිපි පලකිරීම යන සැලසුම් නොකළ කාර්යයන් වෙනුවෙන් රු.1,386,300 ක් වැයකර තිබුණි.

(iii) මානව සම්පත් හා පරිපාලන සහ පර්යේෂණ අංශවල කාර්යසාධන වාර්තාවල භෞතික කාර්යසාධනය දක්වා නොතිබුණි.

(ඇ) පුහුණු පාඨමාලා පැවැත්වීමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පුහුණු පාඨමාලා සඳහා අධ්‍යයන දින දර්ශනයක් හා විධිමත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලා සඳහා බඳවාගත් 1,200 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 201 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබුණි. බිංගිරිය පුහුණු මධ්‍යස්ථානයේ එක් පාඨමාලාවක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා බඳවාගත් සිසුන් 12 න් 10 ක් පාඨමාලාව හැර ගොස් තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ පුහුණු මධ්‍යස්ථානය වසා දමා තිබුණි.

(iii) වර්ෂය තුළ ආරම්භ කිරීමට නියමිතව තිබූ මඩකලපුව හා ත්‍රිකුණාමලය පුහුණු මධ්‍යස්ථාන වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි.

(iv) ක්‍රියාකාරී සැලැස්මේ නොවූ පාඨමාලා දෙකක් සඳහා සිසුන් 133 ක් බඳවාගෙන තිබුණි.

(ඈ) ආයතනය පිහුටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අදාලව පහත කරුණ නිරීක්ෂණය විය.

ආයතනය පිහිටුවීමේ අරමුණු අතර වූ මැණික් ඛනිජ පිළිබඳ සමීක්ෂණයන් හා පර්යේෂණ සිදු කිරීම මගින් හඳුනාගත් මැණික් නිධි රටේ ආර්ථික සංවර්ධනයට උකහා දීම, කර්මාන්තයේ සංවර්ධනය උදෙසා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත්ව උපදෙස් සැපයීම හා අගය වැඩි කිරීමේ ක්‍රමවේදයන් සහ සොයාගැනීම් ප්‍රචලිත කර කර්මාන්තය සංවර්ධනය කිරීම වෙනුවෙන් ආයතනයේ දායකත්වය අවම මට්ටමක විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගාස්තු අයකර ගෙවුඩ තාපකරණය කරදීමේ මහජන සේවාවක් ආරම්භ කර තිබුණද සේවාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ එයින් ලැබූ ආදායම රු.20,000 ක් පමණක් විය.

(ආ) ආයතනයේ නිලධාරියෙකු විසින් 2007 වර්ෂයේදී සිදු කරන ලද රු. 2,395,749 ක රන් රිදී වංචාවක් සම්බන්ධයෙන් තවදුරටත් අයවිය යුතු රු.1,495,749 ක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2009 සිට 2014 වර්ෂවලට අදාලව වැටුප් වර්ධන හා දීමනා ලෙස ආයතනයේ සේවකයන් වෙත වැඩිකර ගෙවා තිබූ එකතු වටිනාකම වූ රු.2,151,320 ක මුදල එලෙස ආපසු අයකර ගැනීමක් 2016 මාර්තු දක්වාම සිදුකර නොතිබුණි. 2016 මාර්තු 29 දිනැති ආයතනයේ සභාපතිවරයාගේ තිරණය පරිදි මුදල් රෙගුලාසි 119 ට පටහැනිව අදාල සේවකයා විශ්‍රාම ගැනීමට නියමිත දිනය දක්වා රු.50 ත් රු.1942 ත් අතර මාසික වාරික වලින් අය කර ගැනීමට තිරණය කර තිබුණි. මෙලෙස සමාලෝචිත වර්ෂය අවසානය වනවිට තවදුරටත් අයවිය යුතු මුදල රු.1,925,086 ක් විය. රු.619,646 ක මුදලක් අයකර ගත යුතු නිලධාරියෙකු 2015 වර්ෂයේ වෙනත් ආයතනයට මුදාහැර තිබීම හේතුවෙන් එදින සිට එකී මුදල් අයවීමක් සිදුව නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

ගෙවුඩ තාපකරණයට අදාළ පර්යේෂණ සඳහා ජාතික විද්‍යා පදනමෙන් රු.4,115,848 ක් 2017 අප්‍රේල් 27 දින ලැබී තිබුණද ඊට අදාළ කිසිඳු කාර්යයක් ඉටුකර නොතිබූ අතර වර්ෂය අවසන් වන විට සේවක වියදම් සඳහා රු.184,149 ක් පමණක් වැයකර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගෙවුඩ තාප පිරියම් කිරීමේ පර්යේෂණ කටයුතු සඳහා රු. 10,977,344 ක් වැයකර 2013 වර්ෂයේදී මිලදීගෙන තිබූ අධි උෂ්ණත්ව විදුලි උදුන එදින සිට විගණිත දිනය වූ 2018 ජූලි 31 වන විටත් කිසිඳු කටයුත්තකට නෙයොදවා රත්නපුර ප්‍රාදේශීය කර්යාලයේ පැවතුණි.

(ආ) 2007 වර්ෂයේදී රු.12,309,013 ක් වැයකර මිලදීගෙන තිබූ භූ විදුම් යන්ත්‍රය සඳහා 2016 වර්ෂය දක්වා රක්ෂණය වෙනුවෙන් රු.1,064,622 ක් ද වැයකර තිබුණි. එහෙත් ආයතනයේ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි වීම හේතුවෙන් වසර 2 කට අධික කාලයක් එම යන්ත්‍රය නිශ්කාර්යව තබා තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ රු.5,974,375 කට මිලදීගෙන තිබූ කැබ් රථයක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම ආර්ථික නොවන බැවින් 2016 වර්ෂයේ සිට නිෂ්කාර්යව තබා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය වූ 135 න් 47 ක් එනම් සියයට 35 ක් පුරප්පාඩුව පැවතුණ අතර වර්ෂ 8 ක් පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා බඳවා ගැනීමට විගණිත දින වූ 2018 ජූලි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2016 ජනවාරි 01 සිට කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ ලකුණු ලබාදීමේ විස්තරාත්මක පරිපාටි කලින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සිය අභිමතය පරිදි කටයුතු කිරීමට අවස්ථාව සැලසී තිබුණි. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්), සහකාර අධ්‍යක්ෂ (රත්න විද්‍යා), පුහුණු නිලධාරි (ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය) යන තනතුරු සඳහා බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ ලකුණු ලබාදීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය අභියෝගයට ලක්ව තිබුණි.

(ඇ) ආයතනයේ රියදුරෙකු නිසි අනුමැතියකින් තොරව 2015 වසරේ සිට සාගර විශ්ව විද්‍යාලයට නිදහස් කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය
---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම
------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් එම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති වීම හේතුවෙන් එම කාර්යයක් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

. (අ) අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණන නිලධාරී සහ විගණන සහකාරවරයෙකු අනුමත කර තිබුණ ද අභ්‍යන්තර විගණන නිලධාරී පමණක් සේවයෙහි යොදවා තිබුණි.

(ආ) 2009 ජුනි 09 දිනැති ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුමත කර තිබුණේ 2017 මැයි 30 දිනදීය. එම වැඩසටහන මගින් සැලසුම් කර තිබූ විගණන කාර්යයන් 20 න් 7කට අදාල පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය
------------------------------------------

#### 6.2.1 ප්‍රසම්පාදනයන්
---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 ප්‍රකාර ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙළ කර ද නොතිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්ම අයවැයට අනුකූල වන ආකාරයට පිළියෙල කර හෝ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. මිලියන 40.1 ක් වූ ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර තිබුණද මිලදී ගෙන තිබුණේ රු.මිලියන 20.4 ක් එනම්, ඉන් සියයට 50.8 ක් වූ භාණ්ඩ පමණි. මෙහිදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු වූ පුහුණු කිරීම් හා පර්යේෂණ අංශවල ප්‍රසම්පාදනවලින් වර්ෂය තුළ ඉටුකරගෙන තිබුණේ පිළිවෙලින් සියයට 53 ක් හා සියයට 35 ක් පමණක් වූ අතර රු.500,000 ක් වැයකර මිලදී ගැනීමට සැලසුම්කර තිබූ පුස්තකාල පොත් මිලදීගෙන නොතිබුණි.

(ඇ) පරිගණක හා මෘදුකාංග මිලදී ගැනීමට රු.මිලියන 2.3 ක් වෙන්කර තිබුණද එම ප්‍රමාණය සියයට 62 කින් ඉක්මවා රු. මිලියන 3.7 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

## 6.3 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 15 සිට සියයට 373 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 සහ 2016 වර්ෂවල වාර්ෂික වාර්තා විගණන දිනය වූ 2018 ජුලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) වෙන් වෙන්ව දැක්විය යුතු වියදම් අයිතම එකට එකතු කර හා පොලී ආදායම් ගිණුම් 3 ක් එකම ගිණුමක දැක්වීම.<br>(ii) උපචිත වියදම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) ප්‍රසම්පාදන කටයුතු | (i) ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව, හා අයවැයට අනුකූලව පිළියෙල කර නොතිබීම.<br>(ii) සැලැස්ම ප්‍රකාරව කටයුතු නොකිරීම සහ අවශ්‍යතා විශ්ලේෂණයකින් තොරව ප්‍රසම්පාදනය සැලසුම්කර තිබීම.<br>(iii) මිලදී ගැනීම් හා කොන්ත්‍රාත් පිරිනැමීමට පෙර පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවක් සිදුකිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ලිපිගොනු නඩත්තු කිරීම හා භාරකාරිත්වය | (i) නිලධාරීන් විසින් ලිපිගොනු විධිමත් ආකාරයෙන් නඩත්තු කර නොතිබීම හා ඒවායේ වගකීම නිසි පරිදි නිලධාරීන් වෙත පවරා දී නොතිබීම.<br>(ii) නිලධාරීන් විදේශගතවීම්වලට අදාළ තොරතුරු ඇතුළත් ලිපිගොනු වෙන වෙනම නඩත්තු කිරීමට හා ගෙවීම් විස්තර වෙන වෙනම පවත්වා නොගැනීම. |
| (ඈ) විභාග පැවැත්වීම | නිසි සැලැස්මක් රහිතව විභාග පැවැත්වීම, පාඨමාලා සහතික සිසුන් වෙත ලබාදීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබීම හා විභාග පරීක්ෂකවරුන් ලෙස වගකිව යුතු නිලධාරීන් පත් නොකිරීම. |
| (ඉ) වාහන උපයෝජනය | වාහන ධාවන සටහන්වල භාවිතා කළ නිලධාරීන් විසින් අත්සන් තබා නොතිබීම, ඉන්ධන ගැළපුම් හා ගමන් කළ දුර සටහන් කර රියදුරු විසින් අත්සන් යොදා නොතිබීම. |
| (ඊ) කාර්යසාධන වාර්තා | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යසාධන වාර්තා කාලීනව සමාලෝචනය කර නොතිබීම. |